# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,193 — 1960 සැප්තැම්බර් 2 වැනි සිකුරාද — 2.9.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 665 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 668 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 672 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 682 | විවිධ දැන්වීම් ... ... ... | 682 |



## තනතුරු – ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන් කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස අන් හැම අවස්ථාවකදීම අධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල ටයිප් ගැසීම පමණක් පුහුණු කිරීමේ පන්ති

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන්නට යන මේ පුහුණු කිරීමේ පන්තිවලට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම ඒ සඳහා අයදුම් පත් එවන ලෙස මෙයින් දන්වමි. මේ පන්ති සමසක් පමණ කාලයක් කායසීංල වේලාව අතර තුර කොළඹ දී පවත්වනු ලැබේ. පුහුණු වන්නන් 20 දෙනෙකුට ඉඩ ඇත.

2. අවශ්‍ය සුදුසුකම්.—හැම අයදුම්කරුම/අයදුම්කාරියම—

(අ) ලාංකිකයකු බව ප්‍රත්‍යක්ෂ වන සේ කරුණු ඉදිරිපත් කළ යුතුය. (ලාංකිකයකු යන්නෙන් අදහස් කරනුයේ පෙළ පතින් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියකු වීමය);

(ඉ) සිංහල භාෂාවෙන් හා යටත් පිරිසෙයින් තවත් විෂයයන් දෙකකින්වත් සම්මාන (සී ලකුණේ) සාමාර්ථයන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට වඩා උසස් විභාගයකින් සමර්ථ වී තිබිය යුතු ය;

(උ) 1960.9.16 වැනි දිනට වයස 17ට අඩු හෝ 22ට වැඩි හෝ නොවිය යුතු ය;

(එ) ඉතා හොඳ චරිතයකින් හා ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතු ය.

3. කොළඹදී පවත්වන සම්මුඛ පරීක්ෂණයකට හා විභාගයකට අයදුම්කරුවන්/අයදුම්කාරියන් පෙනී සිටිය යුතු ය. ඒවා පවත්වන වේලාව හා ස්ථානය පසුව දන්වනු ලැබේ. ඒ සඳහා පැමිණීමට යන වියදම් හා සෙසු වියදම් ගෙවනු නොලැබේ. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අයදුම් පතෙහි යම් අසත්‍ය සටහනක් තිබී, තෝරා ගනු ලැබීමට පෙර, ඒ බව දැන ගතහොත් එයින් ම ඔහු/ඇ නුසුදුසු වීමටද තෝරාගනු ලැබීමෙන් පසු දැනගත හොත් ඔහු/ඇ අස්කර දමනු ලැබීමට ද සිදුවිය හැකිය.

4. පුහුණු වන කාලය තුළදී කිසිම ගෙවීමක් කරනු නොලැබේ. පුහුණුව අවසානයේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන්ට රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුවේ හෝ රාජ්‍ය සේවයෙහි හෝ තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් හෝ රැකී රක්ෂා දීම ගැන කිසිසේත් ඇප වෙන්නේ නැත. එහෙත් සුදුසුකම් ඇතොත් ඔවුනට ආණ්ඩුව යටතේ පවතින මාරු කළ හැකි සිංහල ටයිප් ගසන්නන්ගේ සේවයට ඇතුළත් වීම සඳහා පැවැත්වෙන විභාගයට පෙනී සිටීමට ඉඩ ලැබෙන්නේ ය.

5. පුහුණුවීමේ කාලයේ දී වරින්වර පරීක්ෂණයන් පවත්වා ඒවායේ ප්‍රතිඵල අනුව ආධුනිකයන්ට තව දුරටත් පුහුණු වීමට ඉඩ දෙනු ලැබේ. යම් ආධුනිකයකුගේ/ආධුනිකාවකගේ පැමිණීම හෝ ඉගෙනීම හෝ සාමාන්‍ය යෝග්‍යතාව හෝ හැසිරීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව තෘප්තියට පත් නොවේ නම්, පුහුණු වීමේ කාලය අතරතුර කොයි විටෙකදී වුවත් ඔහු/ඇ පන්තියෙන් වහාම අස්කර දමනු ලබන්නට පුළුවන. එසේ අස් කර දමනු ලැබූවෙක් පසුව පවත්වන පුහුණු කිරීමේ පන්තියට ඇතුළත් වීමට නුසුදුස්සෙක් වන්නේ ය. පුහුණුව අවසානයේ දී යෝග්‍යතාව තීරණය කරන විභාගයක් පවත්වා ඒ විභාගයෙන් සමර්ථ වූවන්ට සහතික පත් දෙනු ලැබේ. කලින් කල නිකුත් කරන ව්‍යවස්ථාවන් හා නියමයන් අනුව කටයුතු කරන බවට ආධුනිකයා/ආධුනිකාව විසින් ම නියමිත පොරොන්දු පත්‍රයක් අත්සන් කළ යුතු ය.

6. දැන දැනම වූ නොසැලකිල්ලක් හෝ නදබල අප්‍රවේසම් කමක් නිසා බඩු නැතිවීමක් හෝ උපකරණ ආදියට පලුදුවක් හෝ වුවහොත් අලාභය ගෙවන බවට ඇපකාරයන් දෙදෙනකු ඇපයට තබා රු. 100ක ඇප පත්‍රයකට අයදුම්කරුවන් ඇතුළත් කරගනු ලැබූ විට අත්සන් කළ යුතු ය.

7. අයදුම් පත් එවිය යුත්තේ පහත අත්සන් කරන නිලධාරි මහතාගේ පුද්ගලික නාමයට නොව, රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුවේ "රාජ්‍යභාෂා කටයුතු පිළිබඳ විශේෂ කොමසාරිස් තැන, තැපැල් පෙට්ටිය 598, කොළඹ 7" යන ලිපිනයටය. අයදුම් පත් මෙහි පහත පළවන ආදර්ශ පිටපත අනුව තමාගේ අත් අකුරෙන් ම ලියා 1960.9.16 වැනි දිනට හෝ ඊට මත්තෙන් ලැබෙන්නට එවිය යුතු ය.

රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ විශේෂ කොමසාරිස්.

1960 අගෝස්තු මස 27 වැනි දින,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
22, ඊඩ් මාවත,
කොළඹ 7.

### සිංහල ටයිප් ගැසීම පුහුණු කිරීමේ පංතියට ඇතුළත් වීම සඳහා අයදුම් පත

(1) සම්පූර්ණ නම (පැහැදිලිව ලියන්න) :————.

(2) සම්පූර්ණ ලිපිනය :————.

(3) ජාතිය (ලාංකිකයකු වූයේ පෙළපතින්ද නැතහොත් ලියාපදිංචි වීමෙන්ද යන බව සඳහන් කරන්න.) :————.

(4) 60.9.16 වන දිනට වයස හා උපන් දින (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය—මුල් සහතික නොවේ.) :————.
————.

(5) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(6) විවාහක ද? අවිවාහක ද? :————.

(7) සමර්ථ වූ උසස්ම විභාගය, විෂයයන් හා දිනය :————.

(8) ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සිංහල භාෂාව සම්මාන සහිතව සමර්ථ වූ බවට ප්‍රධානාචාර්ය තුමාගේ සහතිකය :————.

(9) ඉගෙනීම ලැබූ පාඨශාලා (දිනයන් සමග) :————.

(10) සිංහල දැනුම පිළිබඳ විශේෂ සුදුසුකම් ඇතොත් ඒ බව :————.

(11) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි ටයිප් ගැසීම පිළිබඳ දැනුමක් තිබේද? :————.

(12) ඉංග්‍රීසි පිළිබඳ දැනුමක් ඇතොත් ඒ කොපමණ ද යන වග :
————.

(13) දැන් රක්ෂාවක යෙදී සිටී නම් ඒ බව :————.

(14) පියාගේ හෝ භාරකාරයාගේ හෝ නම හා ඔහුට/ඇයට ලියුම් ලැබෙන පිළිවෙළ :————.

(15) තමා ගැන තොරතුරු විමසිය යුත්තන් දෙදෙනෙකුගේ නම් හා ලියුම් ලැබෙන පිළිවෙළ :————.

(16) අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සුදුසුකම් හා චරිතය පිළිබඳ සහතික ලබාගත් අයගේ නම් හා ලිපිනයන්, මේ සහතික පත්වල පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතුයි. එක් සහතිකයක් තමා අන්තිමට ඉගෙනගත් පාසැලේ මුල් ගුරු තුමාගෙන් විය යුතු යි :————.

(17) වෙනත් සුදුසුකම් :————.

(18) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සම්මාන සාමාර්ථ්‍ය ලැබූ විෂයයන් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගබඩා භාරකාර තනතුරු (ගොවිපලවල්හි හා ව්‍යාප්ති මධ්‍යස්ථාන)

රජයේ දෙපාර්තමේන්තුවල තාවකාලික ගබඩා භාරකාර සේවකයින්ගෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ (ගොවිපලවල හා ව්‍යාප්ති මධ්‍යස්ථානවල්වල) ගබඩා භාරකරුවන් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය :—මෙම තනතුරට අදාල වැටුප් ක්‍රමය වර්ෂයකට රුපියල් 888—72—2,184ක් වේ. වැටුප වර්ෂයකට රුපියල් 1,608 වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් විය යුතුය.

3. සේවා කොන්දේසි :—

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත්වේ.

(ii) තෝරාගත් අයදුම්කරුවන් විසින් අවුරුදු තුනක සේවා කාලය තුළදී තමා සේවය කරන ප්‍රදේශයේ වැසියන් සමග සිංහලෙන් හා දෙමළෙන් රාජකාරී කටයුතු කිරීම සඳහා එකී භාෂාවන්ගෙන් ප්‍රවීණතාවයක් ලබාගත යුතුය.

4. සුදුසුකම් :—සෑම අපේක්ෂකයෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

(අ) (i) රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක අඩු වශයෙන් තුන් අවුරුද්දක ගබඩා භාරකාර පලපුරුද්දක් හා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්වී සිටීම, අවුරුදුපතා අවශ්‍යවන භාණ්ඩ වර්ග ඇස්තමේන්තු කිරීම, අගය තක්සේරු කිරීම, භාණ්ඩ ඉල්ලුම් පත්‍ර සකස් කිරීම හා කායසීලීය වැඩ පිළිබඳ පලපුරුද්ද ආදී අතිරේක සුදුසුකම් තිබීම

හෝ

(ii) රජයේ දෙපාර්තමේන්තුවක අවුරුදු 5 කට නොඅඩු ගබඩා භාරකාර සේවයේ පළපුරුද්දක් හා කණිෂ්ඨ පාඨශාලා විභාගයෙන් සමත්වී සිටීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත වීම.

5. සියළුම ඉල්ලුම්පත්‍රවලට පහත සඳහන් සහතිකපත්‍රවල පිටපත් අමුනා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකයේ පිටපත (සැළකිය යුතුයි :—බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ නීති සංග්‍රහය අනුව නිකුත් කළ උප්පැන්න සහතික පත්‍රය පිළිගනු නොලැබේ.)

(ii) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පිළිබඳ උසස්තම සහතිකපත්‍ර වල පිටපත්.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයෙහි පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසිද කියවා බලන්න.

7. පහත දක්වෙන ආකෘති පත්‍රයට අනුකූල වනසේ පිළියෙල කළ ඉල්ලුම් පත්‍ර 1960 සැප්තැම්බර් මස 19 වැනි දින හෝ ඊට පෙර පේරාදෙණියේ කෘෂිකර්ම අධ්‍යක්‍ෂවරයා වෙත ලැබෙන ලෙස ඉල්ලුම් කරුගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ මාර්ගයෙන් එවිය යුතුය. මොනම කරුණක් නිසා හෝ කෘෂිකර්ම අධ්‍යක්‍ෂගේ පුද්ගලික නමට ඉල්ලුම්පත් එවිය යුතු නොවේ. මේ සඳහා විශෙෂ ආකෘතිපත්‍ර සපයනු නොලැබේ.

ඒ. වී. ර්චඩ්ස්,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්‍ෂ.

1960 අගෝස්තු මස 17 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව—පේරාදෙණිය

ගබඩා භාරකාර තනතුරු (ගොවිපලවල හා ව්‍යාප්ති මධ්‍යස්ථානවල) සඳහා ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා වයස :————.
4. උපන් ස්ථානය :————.

(අ) අයදුම්කරුගේ :————.

(ආ) අයදුම්කරුගේ පියාගේ :————.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ සීයාගේ :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

අයදුම්කරු ලංකාවේ උපත ලබා සිටී නම්, (අ) වගන්තිය ඇතුළු (ආ) වගන්තිය හෝ (ඇ) (ඈ) වගන්ති දෙකද පිරවිය යුතුය. (අයදුම්කරු ලංකාවේ උපත නොලැබුනේ නම්) (අ) වගන්තිය ඇතුළු (ආ) සහ (ඇ) වගන්තිය හෝ (ඇ) (ඈ) වගන්ති දෙක පිරවිය යුතුය.

5. අයදුම්කරු ලියාපදිංචි වීමෙන් හෝ පරම්පරාවෙන් ලංකාවේ පුරවැසි භාවය ලබා සිටීද ? :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. අවුරුදු පතා අවශ්‍ය භාණ්ඩවර්ග ඇස්තමේන්තු කිරීම හා අගය තක්සේරු කිරීමේ, භාණ්ඩ ඉල්ලුම් පත්‍ර සකස් කිරීම හා කාර්යාලීය වැඩ පිළිබඳ පළපුරුද්ද :————.
8. දැනට කරණ රක්‍ෂාව :————.
9. කලින් කළ රක්‍ෂාවල් හා ඒ පිළිබඳ විස්තර :————.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

මගේ අංකය :————.

කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වෙතය.

(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය)

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

**තැපැල් ස්ථානාධිපති සහ සංඥදායකයින් බඳවා ගැනීමේ විභාගය**

1. විභාගය පවත්වන දිනයන් : 1961 ජනවාරි 20, 21.

2. තැපැල් ස්ථානාධිපති සහ සංඥදායකයින් වශයෙන් පිරිමි අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා තරඟ පරීක්‍ෂණයක් කොළඹ සහ පහත සඳහන් මධ්‍යස්ථානවල පවත්වනු ලැබේ :—

ගම්පහ, කළුතර, මොරටුව, මීගමුව, ගාල්ල, හම්බන්තොට, මාතර, මඩකලපුව, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, කෑගල්ල, රත්නපුරය, මහනුවර, මාතලේ, යාපනය, මන්නාරම, පේදුරුතුඩුව, වවුනියාව, බදුල්ල, හලාවත, කුරුණෑගල සහ පුත්තලම.

සැලකිය යුතුයි.—අපේක්‍ෂකයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන විභාග මධ්‍යස්ථාන කිසිවක් වෙතොත් ඒවා අවලංගු කරනු ලැබේ.

3. **විභාගය පවත්වනු ලබන මාධ්‍යය.**—(අ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන් තුනෙන්ම මෙම විභාගය පවත්වනු ලැබේ.

(ආ) සිංහල මාධ්‍යයෙන් සුදුසුවීමේ විභාගය සමත් වූ අයදුම්කරුවෝ ඒ මාධ්‍යයෙන්ම මෙම විභාගයට පෙනී සිටිය යුත්තාහ. දෙමළ හෝ ඉංග්‍රීසි හෝ මාධ්‍යයෙන් සුදුසුවීමේ විභාගය සමත්වූවෝ මෙම විභාගය සඳහා සිංහල මාධ්‍යය තෝරා ගනිතොත් මිස ඔවුන් සාමාර්ථ්‍යය ලත් මාධ්‍යයෙන්ම මෙම විභාගයට පෙනී සිටිය යුත්තාහ, මෙහි පහත දක්වෙන 4.(3) ඡේදයෙහි "ඉ" අක්ෂරය යටතේ දක්වෙන සුදුසුකම් ඇත්තෝ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, තමන් සාමාර්ථ්‍යය ලැබූ මාධ්‍යයෙන්ම මෙම විභාගයට පෙනී සිටිය යුත්තාහ. එහෙත් දෙමළ හෝ ඉංග්‍රීසි හෝ මාධ්‍යයෙන් කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථ්‍යය ලත් අයට මෙම විභාගය සඳහා සිංහල මාධ්‍යය තෝරා ගත හැකිය.

(ඇ) අධ්‍යාපන සුදුසුකම් ගැන සැලකීමක් නැතිව මෙම විභාගයට පෙනී සිටීමට අවසර ඇත්තාවූ සහ 4 (3) වෙනි ඡේදයෙහි දක්වෙන සුදුසුකම් ලැබීමේ කිසිම විභාගයකින් සාමාර්ථ්‍යය නොලැබූ තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ දැනටමත් සේවයෙහි යෙදී සිටින නිලධාරීන් ඔවුන් අධ්‍යාපනය ලැබූ මාධ්‍යයෙන්ම මෙම විභාගයට පෙනී සිටිය යුතුයි. එහෙත් දෙමළ හෝ ඉංග්‍රීසි හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූවන්ට මෙම විභාගයට පෙනී සිටීම සඳහා සිංහල මාධ්‍යය තෝරා ගත හැකිය.

4. **සුදුසුකම්—සාමාන්‍ය කොන්දේසි.**—(1) අයදුම්කරුවෝ යහපත් චරිතයකින් යුක්තවිය යුත්තාහ.

(2) අයදුම්කරුවෝ ලාංකිකයින් විය යුත්තාහ.
මේ පත්වීම් පිළිබඳ කරුණු උදෙසා "ලාංකික" යන්නෙන් අදහස් කරනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි වීමෙන් හෝ ලංකාවේ පුර වැසි බව ලත් අයය.

(3) අයදුම්කරුවෝ යටත් පිරිසෙයින්—

(අ) සිංහල පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ,

(ආ) දෙමළ පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ,

(ඇ) ඉංග්‍රීසි පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ,

(ඈ) ලංකා කාර්මික විද්‍යාලයේ අවසාන වාණිජ සහතික පත්‍ර විභාග යෙන් හෝ සාමාර්ථ්‍ය ලබා සිටිය යුත්තාහ.

(ඉ) එසේ නැතහොත්,

(i) කේම්බ්‍රිජ් ජූනියර් සහතික පත්‍රය.

(ii) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාඨශාලා කණිෂ්ඨ සහතික පත්‍රය (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි)

(iii) අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිළිගත් පාඨශාලාවක කණිෂ්ඨ සහතික පත්‍රය (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි) යන මේවා සින් එකක් සමග පහත සඳහන් විභාගයකින්ද සාමාර්ථ්‍යය ලබා සිටිය යුත්තාහ :—

(iv) ලංඩන් වාණිජ මණ්ඩලයේ ලංකා පරිපාටිය යටතේ—වාණිජ අධ්‍යාපනික සහතික පත්‍රය (පොදු වාණිජ හෝ ලඝු ලෙඛක ටයිප්කාර අංශය) (විදේශ) හෝ උසස් වාණිජ අධ්‍යාපනික සහතික පත්‍රය (පොදු වාණිජ හෝ ලඝු ලේඛක ටයිප්කර අංශය) (විදේශ)

(v) ලංකා වාණිජ මණ්ඩලය සහ ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිරිනමනු ලබන වාණිජ අධ්‍යාපන සහතික පත්‍රය (පොදු වානිජ හෝ ලඝු ලේඛක ටයිප්කාර අංශය) හෝ උසස් වානිජ අධ්‍යාපන සහතික පත්‍රය (පොදු වානිජ හෝ ලඝු ලේඛක ටයිප්කාර අංශය).

(iii) ඉගෙනීම අවසානයේදී අයදුම්කරුවන් පුහුණුව ලැබූ විෂය යන් පිළිබඳ පරීක්ෂණයකට ඔවුන් භාජනය කරනු ලැබේ. එයින් සාමාර්ථය ලබන අය පුරප්පාඩු ඇති වන පරිද්දෙන් අවුරුදු තුනක ආධුනික කාලයක් පිට තැපැල් ස්ථානාධිපති හා සංඥාදායක සේව යට පත්කරනු ලැබේ. මෙහි පහත දක්වෙන (iv) කොන්දේසියේ නිර්දේශයක්ට යටත්ව මේ පරීක්ෂණයේ දී ප්‍රතික්ෂේපවන අයදුම් කරුවන් තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සේවයට නුසුදුස්සන් වනු ඇත.

(iv) යම්කිසි ඉල්ලුම්කරුවකුට විදුලි සංදේශ අධිකාරීන්ගේ නිර්දේශය පිට විශෙෂ අවස්ථාවන් හිදී සුදුසුයයි හැඟෙන වැඩිපුර කාලයක් තම වියදමින් මෙම අභ්‍යාස විද්‍යාලයේ සිටීමට පෝස්ට්මාස්ටර් ජනරාල්ට අවසර දිය හැක. එම කාල පරිච්ඡේදය අවසානයේදී එබඳු ඉල්ලුම්කරුවන් ගැන විශෙෂ පරීක්ෂණයක් කරනු ලැබේ.

(v) තැපැල් සහ විදුලි පණිවුඩ අභ්‍යාස විද්‍යාලයේ මුළු පාඨමාලාව සම්පූර්ණ කිරීමට පෙර තම කැමැත්තෙන්ම ඉල්ලා අස්වන අයදුම් කරුවන්ට එම පාසැලේ පුහුණුව ලැබූ කාලය තුළ ලබාගත් සියලුම දීමනා මුදල් ආපසු ගෙවන ලෙස නියම කරනු ලැබේ.

(vi) සමසක සම්පූර්ණ පුහුණුව ලබා දීමට පෙර තැපැල් ස්ථානාධි පති සහ සංඥාදායක ශ්‍රේණියට පත්කරන ලද අයදුම්කරුවන් තැපැල් සහ විදුලි පණිවුඩ අභ්‍යාස විද්‍යාලයට පුහුණුව සඳහා කැඳවූ විට, පුහුණුව අවසානයෙන් පසු පළමුවන තුන් අවුරුද්ද තුළ තැපැල් ස්ථානාධිපති සහ සංඥාදායක සේවය අත් හැර යන්නේ නම්, තමන් පුහුණුව ලැබූ කාලය තුළ ලැබූ සියළුම දීමනා මුදල් ආපසු ගෙවන බවට පොරොන්දු පත්‍රයකට සහ ගිවිසුමකට අත්සන් කළ යුත්තාහ.

(vii) තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ තැපැල් ස්ථානාධිපති සහ සංඥාදායකයින් වශයෙන් පත්කිරීම සඳහා තෝරාගත් අයදුම් කරුවන්ට ගිවිසුම් පත්‍රයෙහි ඉඩදී තිබෙන පරිදි හැර වෙන කිසියම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක ඇතුලත් වීමේ විභාගයකට පෙනී සිටීමට හෝ වෙන කිසියම් ආණ්ඩුවේ දෙපාර්ත මේන්තුවක තනතුරක් ඉල්ලීමට හෝ භාර ගැනීමට හෝ අවසර දෙනු නොලැබේ.

(viii) ඉරුදින හා නිවාඩු දිනද ඇතුළුව සෑම දිනකම රාජකාරිය කිරීමට තැපැල් ස්ථානාධිපති සහ සංඥාදායකවරු බැඳී සිටිති. තැපැල් කන්තෝරු නිවාඩු දින හැර අනික් නිවාඩු දින වල කරන රාජකාරිය සඳහා කිසියම් අතිරේක මුදලක් ලැබීමට ඔවුන්ට අයිතියක් නැත. දිවා කාලයෙහි හෝ රාත්‍රී කාලයෙහි හෝ ඕනෑම වේලාවක ආරම්භ වන හෝ කෙළවර වන හෝ රාජකාරී වාරයන්ට ඔවුහු පැමිණිය යුත්තාහ. ඔවුන් ඒ ඒ ස්ථාන වලට මාරු කිරීමට හෝ ලංකාවේ ඕනෑම ස්ථානයක නතර කර තැබීමට හෝ ඉඩ තිබේ.

(ix) තැපැල් ස්ථානාධිපති සහ සංඥාදායකවරුන් මුදලින් රුපියල් 2,000 ක් ඇප තැබිය යුතුය. වාර්ෂික වැටුප් මුදල රුපියල් 1,000 කට වැඩි නොවන කල්හි මසකට රුපියල් 7.50 බැගින් හෝ වාර්ෂික වැටුප් මුදල රුපියල් 1,000 කට වැඩි වන කල්හි රුපියල් 10 බැගින් හෝ මාසික කොටස් වශයෙන් මෙම ඇප මුදල අඩුකර ගනු ලැබේ.

(x) පත්වීම කාර්ය සංවිධාන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිසමේ රෙගුලාසි, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ ආණ්ඩුව විසින් කලින් කළ නිකුත් කරනු ලබන අනිකුත් ව්‍යවස්ථා සහ රෙගුලාසි වලටද යටත් වේ.

(xi) ලංකාවේ ඕනෑම තැනක සේවය කිරීමට තමන් තුළ ඇති ශාරීරික යොග්‍යතාවය ගැන ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු ලවා තමන් පරීක්ෂා කරවා ගැනීමට, සමත්වූ අයදුම් කරුවන්ට නියම කරනු ලැබේ. මේ පරීක්ෂණයේදී සෞඛ්‍ය තත්ත්වය අනුව ඔහු නුසුදුසු බව පෙනී ගියහොත් ඔහුගේ තාවකාලික පත්වීම අවලංගු කරනු ලැබේ.

(xii) සාමාර්ථය ලැබූ අයදුම් කරුවන් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිසද, විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පණතේ විධි විධාන ක්‍රියාවේ යෙදවීම පිණිසද, දැනටමත් පනවා ඇති හෝ මින් මතුවට පනවනු ලබන හෝ ඕනෑම ව්‍යවස්ථාව කට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(xiii) ඉංග්‍රීසි හෝ දෙමළ මාධ්‍යයෙන් මේ විභාගයට පෙනී සිට පත්වීම සඳහා තෝරාගනු ලබන අයදුම් කරුවන් තම සෝදිසි කාල පරිච්ඡේදය තුළදී සිංහල උගත යුතුය. සෝදිසි කාලසීමාව ඉකුත් වීමෙන්පසු ඒ අයදුම්කරුවන්ගේ පත්වීම් ස්ථිර කිරීම රඳා පවත්නේ වෙනත් කරුණුද ඇතුළුව සිංහල පරීක්ෂණයකින් සමත්වීම උඩය.

(xiv) තම සෝදිසි කාලය තුළ සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියම තත්ත්වයට ළඟා විය නොහැකිවූ අය රාජ්‍ය භාෂාව ඉගෙන ගැනීම සඳහා සැබෑ උත්සාහයක් දරා තිබෙන බව පෝස්ට්මාස්ටර් ජනරාල්ට ඒත්තු ගියහොත් සේවයෙන් අස් නොකරනු ලැබිය හැක. ඉන්පසු සැහෙන කාලයක් ඇතුළත ආධුනිකයා එම පරීක්ෂණයෙන් සමත් වුවහොත් පෝස්ට්මාස්ටර් ජනරාල්ගේ අභිමතය පරිදි ඔහු ජ්‍යෙෂ්ඨත්වයෙන් පහළ යැමද වෙනස් කරනු ලැබේ.

8. ඉල්ලුම් පත්‍ර.—

(i) මේ විභාගයට ඇතුලත් වීමේ අයදුම් පත්‍ර සැප්තැම්බර් 30 වෙනි දින දක්වා පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්යාලයෙන් ලබාගත හැකි පෝරම වල ලියා පෝස්ට්මාස්ටර් ජනරාල් නමටම එවිය යුතුය. පෝරම ඉල්ලුම් කරන විට තමන් විභාගයට පෙනී සිටින මාධ්‍යය (එනම් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) කුමක්දැයි අයදුම් කරුවන් විසින් සඳහන් කළ යුතුය.

(ii) සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍ර 1960 ඔක්තෝබර් 8 වෙනි දින හෝ ඊට මත්තෙන් කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයේ පෝස්ට්මාස්ටර් ජනරාල්ට ලැබෙනසේ රෙජිස්තර තැපෑලෙන් එවිය යුතුය. මෙදිනෙන් පසු ලැබෙන අයදුම්පත්‍ර කිසිවක් වෙතොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කවරයේ ඉහළ වම් කෙළවරෙහි විභාගයේ නම පැහැදිළිව ලියා එවිය යුතුය.

(iii) අයදුම් පත්‍රයෙහි රුපියල් 15 ක් වටිනා මුද්දර අලවා යථා පරිදි අවලංගු කර තිබිය යුතුය. (දෙපාර්තමේන්තුවේ දැනටමත් සේවයෙහි යෙදී සිටින නිලධාරීන්—එනම් බඳවා ගැනීම පෝස්ට්මාස් ටර් ජනරාල් පිට පවතින ශ්‍රේණිවලට හෝ සේවාවන්ට හෝ අයත් සේවකයින් මුද්දර ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ.)

(iv) දැනටමත් ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත අයගේ අයදුම් පත්‍ර තම තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. එසේ නොකරන යම්කිසි අයදුම් කරුවකු වෙතොත් ඔහු නුසුදුස්සකු හැටියට සලකනු ලැබේ.

9. විභාගයට ඇතුළත් වීම.—(i) අයදුම් පත්‍ර භාරගනු ලැබූ සෑම අයදුම්කරුවකුටම පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර පෝරමයක් නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම් කරුවන් විසින් තම තමන්ගේ ප්‍රවේශ පත්‍ර පෝරම විභාගය පරි පාලනය කිරීමට පත්කර සිටින නිලධාරිතැනට ඉදිරිපත් කළ යුතුය. ඒ බඳු ප්‍රවේශ පත්‍ර පෝරමයක් ඉදිරිපත් නො කරන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) ඉල්ලුම්කරුවන්ට තමන් නියම කර තිබෙන විභාග ස්ථාන යෙහිම විභාගයට පෙනී සිටිය යුතුය. තමාට නියමකර ඇති විභාග ස්ථානය හැර වෙන විභාග ස්ථානයකට පැමිණෙන අයදුම් කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(iii) කාල සටහනෙහි පිටපතක් ද අයදුම් කරුවන් සඳහා සකස්වූ ව්‍යවස්ථා සහ මගපෙන්වීමේ උපදෙස් ද ප්‍රවේශ පත්‍ර පෝරම සමඟ ඔවුන්ට ලැබෙන්නට සලස්වනු ලැබේ. අයදුම්කරුවෝ මේ ව්‍යවස්ථා පිළිපැදීමට බැඳී සිටිති. මේ ව්‍යවස්ථා කඩ කිරීම් කිසිවක් පිළිබඳව පෝස්ට්මාස්ටර් ජනරාල් කරන තීරණය අවසාන තීරණය වේ. විභාගයට පෙනී සිටින සෑම අයදුම් කරුවකු විසින් ම ස්වකීය ප්‍රවේශ පත්‍ර පෝරමය විභාග දිනයෙහි විභාග ශාලා පරිපාල කට භාරදිය යුතුය.

(iv) යම්කිසි අයදුම්කරුවකුට විභාගය පවත්වන දිනයට යටත් පිරිසෙයින් හත් දිනකට වත් කලින් තම ප්‍රවේශ පත්‍ර පෝරමය නොලැබුණ හොත් ඔහු විසින් තමාට ප්‍රවේශ පත්‍ර පොරමය නොලැබුණ බව පහත දක්වෙන විස්තරත් සමඟ පෝස්ට්මාස්ටර් ජනරාල් වෙත නොපමාව දන්වා එවිය යුතුය :—

(අ) විභාගයේ නම :————.

(ආ) සම්පූර්ණ නම :————.

(ඇ) සම්පූර්ණ ලිපිනය :————.

(ඈ) අයදුම් පත්‍රය රෙජිස්තර කළ තැපැල් කාර්යාලය, රෙජිස්තර අංකය සහ දිනය :————.

(ඉ) විභාගය සඳහා තෝරාගත් මධ්‍යස්ථානය :————.

(v) අයදුම්කරුවකු විභාගයකට ඇතුළත් කර ගැනීම ඔහුගේ යෝග්‍යතාව පිළිගැනීමක් වශයෙන් සලකනු නොලැබේ.

**සැළකිය යුතුයි** :—එසේ වුවද පෝස්ට්මාස්ටර් ජනරාල් තම අභිමතය පරිදි යම්කිසි ඉල්ලුම් කරුවකුට තාවකාලිකව විභාගයට ඇතුළත් වීමට ඉඩදිය හැකිය. එවැනි ඇතුළත් කිරීම් අනතුරුව ස්ථිර කරනු හෝ අවලංගු කරනු හෝ ඇත.

10. හැඳුනුම් පත්‍ර.—(i) විභාග ශාලාවේදී තමන් පෙනී සිටින එක් එක් විෂයයක් පාසා තමන්ගේ අනන්‍යතාවය පරිපාලක තැනට ඒත්තු යනසේ ඔප්පුකළ යුතුය. ඒ සඳහා මෙහි පහත සඳහන් ලියවිලි වලින් ඕනෑම එකක් භාරගනු ලැබේ :—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පතක්.

(ආ) මේ විභාග දිනයට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් තුළ නිකුත් කරන ලද වලංගු පාස්පෝට් බල පත්‍රයක්,

(ඇ) විභාග දිනයට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් තුළ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකින් අයිතිකරුගේ ඡායාරූපයක් සහිතව නිකුත් කරන ලද ඕනෑම සහතික පත්‍රයක්, බල පත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්.

(ii) තම ප්‍රවේශ පත්‍රයට අතිරේකව ඉහත සඳහන් ලියවිලි වලින් එකක් වත් ඉදිරිපත් නොකරන අයදුම් කරුවන් විභාගයට ඇතුළත් කරගනු නොලැබේ.

11. **යෝග්‍යතාව පිළිබඳ ලියවිලි.**—(i) අයදුම් පත්‍රය සමග වෙන මොනම ලිපි ලේඛනාදියක් නොඑවිය යුතුය. එහෙත් නියමකර තිබෙන පරිද්දෙන් අවශ්‍ය විස්තර සියල්ල ෆෝරමයෙහි සඳහන්ව තිබිය යුතුය. මේ සියළුම කරුණු සම්බන්ධයෙන් අසම්පූර්ණ කම් ඇති අයදුම් පත්‍රයක් වෙතොත් එය ඊට අදාළ කරුණු සමග කල්පනා කර බලා ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ.

(ii) සුදුසුකම් ලැබූ අයදුම් කරුවන් විසින් යෝග්‍යතාව ඔප්පු කිරීම සඳහා ලියවිලි වලින් සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. එබඳු අයදුම් කරුවන් විසින් මේ ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම හෝ පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් ඉල්ලා සිටි කළ රෙජිස්තර තැපැලෙන් නොපමාව එවීම හෝ කළ යුතුය.

(iii) පහත සඳහන් ලියකියවිලිද අවශ්‍යය :—

(අ) යහපත් චරිතය පිළිබඳව වගකිය යුතු පුද්ගලයකුගේ අත්සන් සහිත සහතික පත්‍රයක්,

(ආ) අයදුම්කරුගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කරන ලද පිටපතක්. (පහත සඳහන් සංලක්ෂ්‍යය බලනු.)

**සංලක්ෂ්‍යය.**—(i) පාඨශාලා හෝ අධ්‍යාපනික කටයුතු සඳහා නිකුත් කරන ලද විශෙෂ උප්පැන්න සහතික පත්‍ර හෝ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගත් සහතික කළ ලුහුඬු පිටපතක් හෝ භාර ගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතික පත්‍ර වෙනුවට දිවුරුම් සහතික පත්‍ර හෝ බව්තිස්ම සහතික පත්‍ර භාරගනු නොලැබේ.

(iii) උප්පැන්න සහතික පත්‍රයෙහි දක්වෙන නම/නම් හා ඉල්ලුම්කරු සාමාන්‍යයෙන් භාවිත කරන්නාවූත් ඔහු විභාගයට ඉදිරිපත් කරන්නාවූත් නම/නම් අතර වෙනසක් තිබේ නම් කාරණයට යෝග්‍ය වන පරිදි 1951 අංක 17 දරන උප්පැන්න සහ මරණ ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ 27 හෝ 28 දරණ ව්‍යවස්ථාවේ නියමයන් අනුව උප්පැන්න ලියා පදිංචි කිරීමේ සටහනෙහි දක්වෙන නම වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය. 1953 අංක 15 දරන උප්පැන්න සහ මරණ ලියා පදිංචි කිරීමේ (සංශෝධිත) ආඥාපනතේ 24 (6) ව්‍යවස්ථාව යටතේ උපන්දින සිට අවුරුද්දකට වැඩි කාලයක් ගතවීමෙන් පසු, කරවන ලද උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනක සහතික කරනලද පිටපතක් පත්වීම් දීම පිළිබඳ කරුණු උදෙසා පිළිගනු ලබන්නේ උපන් දිනය තහවුරු කළ සාක්ෂි ගැන කල්පනා කර බැලීමෙන් පසුව පමණකි.

(ඇ) ලංකාවේ පුරවැසියෙක් වශයෙන් ලියාපදිංචිවීමේ සහතික පත්‍රය හෝ පරම්පරාවෙන් පුරවැසිභාවය ලබාගැනීමට කළ ඉල්ලීම පිළිගැනීමේ රාජකාරි ලියමනෙහි මුල් පිටපත (උචිත වන පරිදි.)

(ඈ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රවල මුල් පිටපත්.

(iv) අයදුම් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවේදීම මේ සියළුම ලියවිලි සූදානම් කර තබා ගන්නා ලෙස අයදුම් කරුවන්ට අවවාද කරනු ලැබේ. යම්කිසි ඉල්ලුම් කරුවකු විසින් අවශ්‍ය ලියවිලි සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් නොකළ හොත් හෝ පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් ඉල්ලා සිටිවිට ඒවා ඉදිරිපත් කිරීම ප්‍රමාද කළහොත් හෝ ඔහුගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

12. (i) **අසත්‍ය තොරතුරු සැපයීම ගැන දඬුවම්.**—මේ විභාගයේ රෙගුලාසි අනුව යම්කිසි ඉල්ලුම් කරුවකු ඊට පෙනී සිටීමට යෝග්‍යව නොසිටි බව පෙනී ගියහොත්, විභාගයට පෙරාතුව හෝ එය පවතිද්දී හෝ එයින් පසුව හෝ කවර අවස්ථාවකදී වුවද ඔහුගේ අපෙක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ.

(ii) ඉල්ලුම් කරුවකු විසින් දැන දැනම අසත්‍ය තොරතුරු සපයා ඇති බව පෙනී ගියහොත් හෝ කිසියම් වැදගත් කාරණයක් ඔහු ඕනෑකමින්ම සඟවා තිබුණහොත් හෝ විභාගයට පෙනී සිටීමට ඔහුට සුදුසුකම් නොතිබුණ බව. ඔහු සේවය කරන කාලය තුළ යම්කිසි අවස්ථාවක ඔප්පු වුවහොත් හෝ වහාම ඔහු සේවයෙන් පහකිරීමට ඉඩ තිබේ.

13. **ආපසු ගෙවීම්.**—(i) කිසිම කරුණක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

(ii) මේ විභාගයට ගෙවන ගාස්තු වෙන කිසියම් විභාගයකට මාරු කළ නොහැකිය.

14. **විභාග පරිපාටිය.**—විභාගයට අයත් විෂයයන් සහ එක් එක් විෂයකට නියමිත ලකුණු ගණනද මෙහි පහත දක්වේ. අශෝභන අත් අකුරු හා අක්ෂර වින්‍යාසයේ වැරදි ගැන සියලුම උත්තර පත්‍රිකා වලින් ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිලි ලෙස ලියන ඉල්ලුම් කරුවන් නුසුදුස්සන් වීමට ඉඩ තිබේ.

### I වෙනි කොටස

| | ලකුණු |
|---|---|
| (1) භාෂාව සහ වාක්‍ය රචනය (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) පැය 1½ ... | 150 |
| (2) සාමාන්‍ය සහ ප්‍රාදේශික දැනීම (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) පැය 1 ... | 100 |
| (3) එකතු කිරීම ඇතුළු ගණිතය (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි පැය 1 ... | 100 |
| (4) සාමාන්‍ය බුද්ධිය (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) විනාඩි 45 ... | 100 |
| (5) කියවන විට ලිවීම (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) ... | 100 |
| (6) භූගෝල විද්‍යාව (ලංකාව සහ ලෝකය) (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) පැය 1 ... | 100 |
| (7) ඉංග්‍රීසි විශෙෂ පත්‍රය පැය 1 ... | 100 |

**සැලකිය යුතුයි.**—(i) සිංහල, දෙමළ මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටින සියළුම අයදුම් කරුවන් මේ විශේෂ ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයට උත්තර සැපයිය යුතුය. මේ ප්‍රශ්න පත්‍රයෙහි තත්ත්වය අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයට සමානය. එය සලකනු ලබන්නේ සුදුසුවීමේ පරීක්ෂණයක් වශයෙන් පමණකි. සෑම අයදුම් කරුවකු විසින් ම මේ පත්‍රයට නියමිත ලකුණු ප්‍රමාණයෙන් සියයට 40 ලකුණු ලබාගත යුතුය. එසේ වුවද මේ ප්‍රශ්න පත්‍රය සඳහා ලබාගත් ලකුණු ගණන, එසේ සුදුසුකම් ලැබූවන් අතරෙන් පත්වීම් දීම සඳහා අයදුම්කරුවන් තෝරාගන්නා විට කල්පනාවට ගනු නොලැබේ.

(ii) කවුන්ටර් රාජකාරිවලට අදාල "තැපැල් මග" නමැති සංග්‍රහයේ සහ තැපැල් කන්තෝරු ව්‍යවස්ථාවල දක්වෙන දෙපාර්තමේන්තුවේ කාර්‍ය්‍ය පරිපාටිය පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් දෙනු ලැබේ. මේ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය හැක්කේ මෙහි පහත දක්වෙන වර්ගවල නිලධාරීන්ට පමණකි :—

(අ) සෑම තැපැල් සහකරුවන්ම.

(ආ) සියයට 25 හේ වෙන්කළ පුරප්පාඩු සඳහා තරග කිරීමට සුදුසුකම් ඇති තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සේවයෙහි නියුක්ත සියළුම නිලධාරීන්ට විවෘත තරග පරීක්ෂණයට මෙන්ම සීමිත තරග පරීක්ෂණයට ද භූගෝල විද්‍යාව (ලංකාව හා ලෝකය) වෙනුවට මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට ඉඩ දෙනු ලැබේ.

### II වෙනි කොටස

| | ලකුණු |
|---|---|
| සම්මුඛ පරීක්ෂණය (අයදුම් කරුවන් මුළු විභාගයට පෙනී සිටින භාෂාවෙන් මෙය පවත්වනු ලැබේ.) ... | 100 |

15. විභාගය කොටස් දෙකකින් යුක්තව පවත්වනු ලැබේ. පළමු වෙනි කොටස මුලින්ම පවත්වා එහි ප්‍රතිඵල අනුව ලකුණු පිළිවෙලින් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ඔවුන්ට දැනුම් දෙනු ලබන දිනයක දී එය කොළඹ දී පවත්වනු ඇත. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන සංඛ්‍යාව පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සම්මුඛ පරීක්ෂණය අත්හැරීමට ද ඉඩ තිබේ.

16. **ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම සහ නිලධාරීන් පත් කිරීම.**—සාමාර්ථ්‍යය ලත් අයදුම් කරුවන්ගේ නම් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරවනු ලැබේ. පුරප්පාඩු ඇතිවන පරිද්දෙන් ඔවුන්ට පත්වීම් දෙනු ඇත.

17. තැපැල් ස්ථානාධිපති සහ සංඥාදායක සේවය ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත සේවයකි. වැන්දඹු සහ අනාත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුවේ.

18. ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ II වන ඡේදයේ ආරම්භයෙහි පළකොට ඇති රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම්වලට අදාල පොදු කොන්දේසි බලනු මැනවි.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට්මාස්ටර් ජනරාල්.

ප්‍රධාන තැපැල් කාර්‍ය්‍යාලය,
කොළඹ.
1960.8.26.

5. වැන්ඩර් විවෘත කරනු ලබන වේලාවෙහි පැමිණ සිටීමට කැමති නම් එසේ කිරීමට වැන්ඩර්කරුවන්ට හෝ ඔවුන් විසින් බලය පවරන ලද නියෝජිතයන්ට අවසර දෙනු ලැබේ.

6. 1960 සැප්තැම්බර් 23 වැනි සිකුරාදා පෙ. ව. 10ට සමාජ සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ දී වැන්ඩර් විවෘත කරනු ලැබේ.

7. වැන්ඩර් භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක් ගත වන තෙක් වැන්ඩර්කරුවන් බලාපොරොත්තුවන ගණන් නොවෙනස්ව තබා ගත යුතු බැව් අපේක්ෂිතය.

8. වැන්ඩරය පිළිගැනීමේදී කොන්ත්‍රාත්තුව හරියාකාර ඉටු කරන බවට ඇපකරුවන් ඉදිරිපත් කිරීමක් අවශ්‍ය වුවහොත්, සඵල වූ වැන්ඩරය හිමියා එසේ කිරීමට හැකි තත්ත්වයක සිටිය යුතුවේ.

9. වැන්ඩර් ආකෘති පත්‍ර සඳහා එවන ඉල්ලුම් පත් 1960 සැප්තැම්බර් 19 වැනි සඳුදා දවල් 12න් පසු භාරගනු නොලැබේ. නියමිත ආකෘතියෙහි නොලියැවුණු වැන්ඩර් ගැන සලකා බැලීමක් නොකැරේ.

10. වැඩිපුර විස්තර සමාජ සේවා අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකිය.

ඇන්. කේ. ඒ. ද සිල්වා,
සමාජ සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1960 අගෝස්තු 23 වැනිදා,
කොළඹ දීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ගිණි නිවීමේ යන්ත්‍රයක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවීමයි

කෘෂිකර්ම, ඉඩම් වාරිමාර්ග සහ විදුලි අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 ඔක්තෝම්බර් මස 11 වැනි අඟහරුවාදා උදේ 10 වන තෙක් ගිණි නිවීමේ යන්ත්‍රයක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් අයැදුම් පත් විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර් අයැදුම් කරුවනට ඒ ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ඇත.

රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් අයැදුම්පත් ලියා අනු පිටපතක් ද සමග එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 50 ක් රත්මලානේ වාරිමාර්ග. දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයෙන් හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ලබා ගෙන එහි ඉදිරිපත් කළ විට වර්ෂ 1960 ඔක්තෝම්බර් මස 7 වෙනි සිකුරාදා වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොල දෙනු ලැබේ.

වැඩි විස්තර රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

වර්ෂ 1960 වූ අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේදීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තංගල්ලේ දකුණු කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් හම්බන්තොට උප කොට්ඨාශයෙහි හාතාගල සවිර කම්කරු නිවාසයක් සෑදීම සඳහා 1960 සැප්තැම්බර් මස 20 වන අඟහරුවාද පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ හම්බන්තොට උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරුතුමාගෙන් ලබාගත් පෝරම්වලය. වැඩිදුර කරුණු සඳහා හම්බන්තොට උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉන්ජිනේරුතුමාගෙන් විමසන්න, නැතහොත් 1960.8.23 දින දරණ ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම බලන්න.

රු. 13,500 කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ බවට සාක්ෂි ඉදිරිපත් කළ කොන්ත්‍රාත් කරුවන්ට 60.9.2 දින සිට 60.9.16 වන දින ප. ව. 4.30 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝරම නිකුත් කරණු ලබන්නේ සෑම ටෙන්ඩරයක් සඳහාම රු. 25ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. මෙම මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැක.

චෝ. ල. ද. සී. ආදිහෙට්ටි,
වාරිමාර්ග ඉංජිනේරුතුමා,
හම්බන්තොට.

වාරිමාර්ග කායඹාලය,
හම්බන්තොට, 1960.8.23.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තංගල්ලේ දකුණු කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරුතුමා විසින් හම්බන්තොට උප කොට්ඨාශයෙහි ඌරුබොක්ක ඔය ව්‍යාපාරයේ උඩුකිරිවිල අමුණේ ගංවතුර අලාභහානි අළුත් වැඩියා කිරීම සඳහා 1960 සැප්තැම්බර් මස 20 වන අඟහරුවාදා පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ හම්බන්තොට උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉන්ජිනේරුතුමාගෙන් ලබාගත් පෝරම්වලය. වැඩිදුර කරුණු සඳහා හම්බන්තොට උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉන්ජිනේරුතුමාගෙන් විමසන්න, නැතහොත් 60.8.23 දින දරණ ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම බලන්න.

රු. 20,000 කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ බවට සාක්ෂි ඉදිරිපත් කළ කොන්ත්‍රාත් කරුවන්ට 60.9.2 දින සිට 60.9.16 වන දින ප. ව. 4.30 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරණු ලැබේ. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරණු ලබන්නේ සෑම ටෙන්ඩරයක් සඳහාම රු. 25ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. මෙම මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැක.

චෝ. ල. ද. සී. ආදිහෙට්ටි.
වාරිමාර්ග ඉන්ජිනේරුතුමා
හම්බන්තොට.

වාරිමාර්ග කායඹාලය,
හම්බන්තොට, 1960.8.23

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වව්නියා උතුරු කොට්ඨාශයේ වාරිමාර්ග දෙපාතර්මේන්තුවේ මන්නාරම් උප කොට්ඨාශයට අයිති බඩු බෑමට හා පැටවීමට රු. 10,000කට වැඩියෙන් ඉල්ලීමට පුලුවන් ආණ්ඩුවේ රිජිස්ටර් කොන්ත්‍රාත්කරුවන් වෙත දන්වන ලදී. එම අයගේ ටෙන්ඩර්පත්‍ර 1960.9.27 දින උදේ 9.30 කලින් බාර ගනු ලැබේ. වැඩි විස්තර දැන ගැනීම සඳහා වව්නියා වාරිමාර්ග කායඹාලයෙන් විමසන්න.

ඞී. ඊ. සෝමසුන්දරම්,
වාරිමාර්ග කර්මාන්ත ඉංජිනේරු තුමා,
මන්නාරම් උප කොට්ඨාශය.

1960.8.23

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ත්‍රිකුණාමල පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 60.10.1 සිට 61.9.30 දක්වා වූ මුදල් වර්ෂය තුළ කන්තලේ ව්‍යාපාරයේ ආණ්ඩුවේ බඩු බාහිරාදිය ගෙන යාම සඳහා 1960 සැප්තැම්බර් 20 වෙනිදා පෙරවරු 10 වන තෙක් ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

මේ පිළිබඳ වැඩි විස්තර හා ටෙන්ඩර් පෝර්ම පත්‍ර කන්තලේ ව්‍යාපාරය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක. ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනු පිටපතක් ද සමගය.

1960 සැප්තැම්බර් 17 වෙනිදා වන තෙක් කන්තලේ ව්‍යාපාරය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර නිකුත් කරන්නේ තමන් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් බව ඔප්පුකිරීම සඳහා ඕනෑම කච්චේරියක හෝ මෙහි පහත සඳහන් කායඹාලයෙහි රු. 25ක මුදලක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයට පමණය. රු. 20,000 සහ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ඉඩ ලැබේ.

වාරිමාර්ග ඉංජිනේරු තැන,
කන්තලේ.

1960 අගෝස්තු මස 26 දින,
කන්තලේ දීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරුවේ ඊශාන දිසා භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින්, පොළොන්නරු වාරිමාර්ග උප කොට්ඨාශයේ 1960/61 මුදල් වර්ෂය තුල බඩු ඇදීම සඳහා 1960 සැප්තැම්බර් මස 28 වන දින පූ. භා. 9.30 දක්වා වැන්ඩර් බාරගනු ලැබේ.

2. පොළොන්නරුවේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත යුතු ආකෘති පත්‍ර වල පිළියෙලකරන ලද වැන්ඩර් පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි. වැඩ පිළිබඳ විස්තර පොළොන්නරුවේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නො හැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

(4) **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමග ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

(5) **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහලේකම් කාර්යාලයය, ගාලු මුවදොර, කොළඹ" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කායර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමා ම ගණකාධිකාරී මහතාට (සැපයීම් සහ කොන්ත්‍රාත්) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

(6) **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලෙඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

(7) **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

(8) **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නො වේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

(9) **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

(10) **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතු ද වන්නේ ය.

(11) **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැනගැනීම සඳහා මෙහි දෙවන ඡෙදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

එස්. ඥානසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
මුදල් අංශය, ගාලු මුවදොර,
මහලේකම් කාර්යාලය,
කොළඹ. 29.8.60.

## උපලේඛනය

| (1) සේවය | (2) වසම | (3) මාසයකට කිරි පයින්ට්ස් දළ වශයෙන් | (4) ටෙන්ඩර් පත් අවසාන දිනය |
|---|---|---|---|
| **කුරුණෑගල කොට්ඨාශය** | | | |
| කුරුණෑගල කිරි මණ්ඩලයේ මධ්‍යස්ථානයේ සිට ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කායර්‍යාලයට සහ කුරුණෑගල ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කායර්‍යාලයේ සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | ...කුරුණෑගල | ... 5,270 | 20.9.60 |
| **වවුනියා කොට්ඨාශය** | | | |
| රජයේ ගොවිපළේ සිට වවුනියා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට | ...වවුනියාව | ... 1,050 | 20.9.60 |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
### පිරිසිදු එළකිරි සැපයීම

වර්ෂ 1960 ඔක්තෝබර් මස 1 වැනිදා සිට 1961 සැප්තැම්බර් මස 30 වැනිදායින් අවසන් වන කාලය තුල පිරිසිදු එළකිරි සැපයීම සඳහා ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයට යාබද "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේ දී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැන විසින් ලාංකිකයන්ගෙන් හෝ ලාංකික ආයතනවලින් ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. මේ සමග ඇති උපලෙඛනයේ 4 වැනි තීරයෙහි සඳහන් දින පෙරවරු 10ට ටැන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටැන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ දී ටැන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටැන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් ටැන්ඩර පත්‍රවල සඳහන් කරන මිළ ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටැන්ඩර් කරුවකුට ටැන්ඩර පත්‍ර පරීක්ෂාකර බැලීමට අවශ්‍ය වුවහොත් මගේ හෝ මවිසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියෙකුගේ අනුමතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැක.

3. මේ කාර්යාලයෙන් හෝ කොළඹ, කළුතර, නුවර, මාතලේ, ගාල්ල, මාතර, යාපනය, වව්නියා, මඩකලපුව, අනුරාධපුරය, බදුල්ල, කුරුණෑගල, පුත්තලම, රත්නපුරය සහ කෑගල්ල යන සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්යාලවලින් ලබාගන්නා ලද නියමිත පෝර්මයේ නොවන ටෙන්ඩර පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ පහත සඳහන් සුදුසුකම් ඇති අයට පමණී :—

(අ) ඔහුගේ කිරිපට්ටිය ලියාපදිංචි කරන ලද එකක් විය යුතුයි. එය ලියාපදිංචි කිරීම අනවශ්‍ය ප්‍රදේශයක තිබේ නම්, ඒ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා විසින් පහත සඳහන් කරුණු අලලා නිකුත් කරනු ලබන සහතිකයක් දැරිය යුතුය :—
(1) කිරිපට්ටියේ නම සහ පිහිටි ස්ථානය ;
(2) දැනට අයිතිකරුගේ නම සහ ලිපිනය ;
(3) කිරිපට්ටිය ලියාපදිංචි කර තිබේ ද ? එසේ නම් කුමන කාලයකට ද ?
(4) පට්ටියේ සිටින කිරි දෙනුන් ගණන ;
(5) දවසකට පට්ටියෙන් නිපදවිය හැකි වැඩිම කිරි ප්‍රමාණය ;
(6) කිරි සැපයීමට නියමිත ආරෝග්‍යශාලාවේ සිට පට්ටියට ඇති දුර ප්‍රමාණය ;
(7) පට්ටියේ සිට ආරෝග්‍යශාලාවට කිරි ගෙනයාමට බලාපොරොත්තු වන ක්‍රමය.

(ආ) යම්කිසි ටෙන්ඩර්කරුවකු විසින් තමාගේ ටෙන්ඩරය බාර ගෙන දෙමසක් ගතවීමට පෙර, ආයතනයට නුදුරුව දෙපාර්තමේන්තුව පිළිගන්නා තත්ත්වයේ කිරිපට්ටියක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන්නෙහි නම්, ඒ බවට ලියවිල්ලකින් පොරොන්දුවක් දිය යුතුය. ටෙන්ඩර පෝරමයේ දැක්වෙන පොරොන්දු ලියවිල්ල ටෙන්ඩර්කරු විසින් අත්සන් කළ යුතුයි.

සැ. යු.—මේ ඡෙදයට අයත් සුදුසුකම් රහිතවීම හෝ වෙනත් හේතූන් නිසා ටෙන්ඩර ඉල්ලුම්කරුවකුට ටෙන්ඩර පෝරම නොදිය යුතුය. ටෙන්ඩරය පෝරම නිකුත් නොකිරීමට හේතු දැක්වීමට හෝ නොදැක්වීමට පුළුවන.

4. ඉහත සඳහන් (අ) තීරයෙහි කරුණු අනුව ටෙන්ඩරකරුවන් කිරිපට්ටිය ලියාපදිංචි කළ බවට සහතිකයක් හෝ එම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගෙන් ලබාගන්නා ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් (අ) තීරයේ කරුණු අනුව කිරි පට්ටියක් පිහිටුවීමට ලියවිල්ලකින් පොරොන්දු විය යුතුය.

5. කිරි සැපයීමට නියම ආයතනයට පහසුවෙන් කිරී සැපයීම සඳහා පට්ටිය නුදුරුව තිබිය යුතුය.

